83445

AL/2020/71/S-II(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

විභාග අංකය : ..........................

උපදෙස්:

* I කොටසේ 1 ප්‍රශ්නය ද, II කොටසේ 2, 3 ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* 1 ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මේ **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* I කොටස, II කොටසේ පිළිතුරු පත් සමග **අමුණා භාර දෙන්න**.

## I කොටස

1\. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1. සිංහල අක්ෂර මාලාවෙහි එන 'ය්' යන්න කවර ගණයකට අයත් අක්ෂරයක් ද?
(1) මූර්ධජ අඝෝෂ ඌෂ්ම
(2) තාලුජ අඝෝෂ අර්ධ ස්වර
(3) තාලුජ ඝෝෂ අර්ධ ස්වර
(4) කණ්ඨෞෂ්ඨජ අඝෝෂ
(5) දන්තෞෂ්ඨජ ඝෝෂ අර්ධ ස්වර (......)

1.2. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.
(1) ප්‍රස්ථාවනා, උච්චාරණ, නෂ්ඨාවශිෂ්ට, නික්ලේශී, පළතුරු
(2) ප්‍රස්ථාවනා, උච්ඡාරණ, නශ්ටාවශිෂ්ට, නික්ලේෂී, පලතුරු
(3) ප්‍රස්තාවනා, උච්චාරණ, නෂ්ටාවශිෂ්ට, නික්ලේශී, පලතුරු
(4) ප්‍රස්ථාවනා, උච්චාරණ, නෂ්ඨාවශිෂ්ඨ, නික්ලේෂී, පළතුරු
(5) ප්‍රස්තාවනා, උච්ඡාරණ, නෂ්ඨාවශිෂ්ඨ, නික්ලේශී, පලතුරු (......)

1.3. අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.
(1) ජ්‍යාමිතිය, ජංගම පුස්තකාලය, ජගන්මාතා, ඥාන විභාගය
(2) ඥාන විභාගය, ජ්‍යාමිතිය, ජංගම පුස්තකාලය, ජගන්මාතා
(3) ජගන්මාතා, ජ්‍යාමිතිය, ජංගම පුස්තකාලය, ඥාන විභාගය
(4) ජංගම පුස්තකාලය, ජගන්මාතා, ඥාන විභාගය, ජ්‍යාමිතිය
(5) ජගන්මාතා, ජංගම පුස්තකාලය, ඥාන විභාගය, ජ්‍යාමිතිය (......)

1.4. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) මහාප්‍රාණ අක්ෂරයක් වචනයක මුල නො යෙදේ.
(2) මහාප්‍රාණ අක්ෂර දෙකක් වචනයක එක ළඟ නො යෙදේ.
(3) මහාප්‍රාණ අක්ෂරයකට පසු ව අනුස්වාරය භාවිත නො වේ.
(4) මහාප්‍රාණ අක්ෂරයකට මුලින් විසර්ගය නො යෙදේ.
(5) අල්පප්‍රාණ අක්ෂරයකට මුලින් මහාප්‍රාණ අක්ෂරයක් යෙදේ. (......)

1.5. එකිනෙකට අනුරූප වන සේ යෙදුණු වචන යුගල සහිත වරණය තෝරන්න.
(1) සමරු දෙසුම, මඟුල් බණ, වෙද මැඳුර, රස ගඟුල
(2) සමරු දේශනය, වෛද්‍ය මන්දිරය, විද්‍යා පිබිදුම, සූර්ය එළිය
(3) ආලෝක දහර, සාංවත්සරික උලෙළ, උයන් ක්‍රීඩා, සඳ පහන
(4) දිය කෙළිය, ස්වර සංකේත, සාපේක්ෂ ගනකම, විෂය දැනුම
(5) තෘණ පඳුරු, මේස නද, ගුවන් යාත්‍රාව, ස්ඵෝටන හඬ (......)

[දෙවැනි පිටුව බලන්න.

1.6. තත්සම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) ජලය, විදුලිය, වාතය, සුළඟ
(2) විද්‍යුතය, ධ්වනිය, නාදය, නිද්‍රාව
(3) පද්‍ය, සූක්ෂ්ම, පිළිවෙත, මඬුල්ල
(4) පුෂ්පය, පරාගය, රොන්සුණු, දම්කඳ
(5) සඟපෙළ, අභියාචනය, වලාකුළු, වායුධාරාව (……)

1.7. තද්භව වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) සංසාරය, නිර්වාණය, බුදුසසුන, මෝහය
(2) ජනගහනය, චේතනාව, මෝහනය, සැඳෑ අඳුර
(3) දියදම්, ගමන්මඟ, ගුවන්ගැබ, විසුළු මුහුණ
(4) සොබාදහම, අයුක්තිය, අටලෝදහම, ගුණදායක
(5) මියුරු නාදය, බව තිමිර, තාලරූප, හස්තලීලා (……)

1.8. අව්‍යය සමාස, විශේෂණ සමාස, විභක්ති සමාස, අන්‍යාර්ථ සමාස අනුපිළිවෙළින් යෙදී ඇති වචන පේළිය තෝරන්න.
(1) පාපියුම්, සුවඳ, සරාසඳ, දසබල
(2) සරාසඳ, පාපියුම්, සුවඳ, දසබල
(3) සුවඳ, දසබල, පාපියුම්, සරාසඳ
(4) දසබල, සුවඳ, පාපියුම්, සරාසඳ
(5) සුවඳ, පාපියුම්, සරාසඳ, දසබල (……)

1.9. කෘදන්තයක් **නො වන** වචනයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) කැඩූ, බැලූ, බිණූ, මැරූ
(2) කැඩුම්, බැලුම්, බිණුම්, රැකුම්
(3) පිසමන්, වියමන්, කියමන්, ලියමන්
(4) නටන, බණන, බලන, බසින
(5) නැටිලි, පැනිලි, බැලිලි, පැතලි (……)

1.10. පහත සඳහන් උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද **අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.
(අ) "බලා පලා **යව** අස්වන් ගුරුළු කෙත"
(ආ) "**සිඳිත** මඩිත එක ලෙස පැතිරෙයි සුවඳ"
(ඉ) "ගව්වෙන් ගව්ව දිව මාලිග **සැදේවා**!"
(ඊ) "**දමාලා** යන නරක කුණු කය..."
(1) විධික්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, ආශීර්වාදක්‍රියා
(2) පූර්වක්‍රියා, විධික්‍රියා, ආශීර්වාදක්‍රියා, අසම්භාව්‍යක්‍රියා
(3) අසම්භාව්‍යක්‍රියා, විධික්‍රියා, ආශීර්වාදක්‍රියා, පූර්වක්‍රියා
(4) ආශීර්වාදක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, පූර්වක්‍රියා, විධික්‍රියා
(5) විධික්‍රියා, අසම්භාව්‍යක්‍රියා, ආශීර්වාදක්‍රියා, පූර්වක්‍රියා (……)

1.11. තද්ධිතයක් **නො වන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) තොටි, නැවි, පිනි, සැබි
(2) කෙටි, ගැමි, රැටි, ලෙවි
(3) දැහැමි, නැකැති, ඇඳිරි, සිඟිති
(4) වකුටු, කරටි, පහටි, පැනිති
(5) අරටු, ඉඟටි, කඩිති, කළටි (……)

1.12. උපසර්ගයක් **යෙදී නොමැති** වචනයක් සහිත වරණය තෝරන්න.
(1) සමාගම, සමුපකාර, සංචරණ, සංවර්ධන
(2) අනුකූල, අනුනායක, අනුරූප, අනුශාසන
(3) විරූප, විදේශ, විගමන, විකාල
(4) අවතරණ, අවමාන, අවධාරණ, අවනම්බු
(5) කුකවි, කුකුළු, කුදිටු, කුමන්ත්‍රණ (……)

1.13. නිපාතයක් **නො වන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) අතර, අන්න, අනුව, අනේ
(2) එක්කෝ, එපා, එහෙත්, දැන්
(3) හෙයින්, හෙවත්, හොත්, හෝ
(4) පරිදි, පසු, පිණිස, පිළිබඳ
(5) නැවත, නිතර, කරා, නැම (……)

1.14. **අතිශයෝක්ති** අලංකාරය භාවිතයෙහි ලා **ප්‍රබුද්ධ** කවීහු **උද්‍යෝගිමත්** වෙති.
යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරින් දක්වා ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණාංගවලට ද?
(1) සන්ධි, උපසර්ග, තද්ධිත
(2) සන්ධි, තද්ධිත, උපසර්ග
(3) උපසර්ග, තද්ධිත, සන්ධි
(4) තද්ධිත, සන්ධි, උපසර්ග
(5) උපසර්ග, සන්ධි, තද්ධිත (……)

[තුන්වැනි පිටුව බලන්න.

1.15. සමාන ව්‍යාකරණ ලක්ෂණ ඇතුළත් **නො වන** ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.
(1) කියවූ, කරවූ, පෙන්වූ, දැවූ
(2) පැවසූවා ය, පෙන්වූවා ය, විමසූවා ය, වැනසූවා ය
(3) කියූහ, දැක්වූහ, පැවසූහ, ලියූහ
(4) ඇසූ, නැසූ, පිසූ, විසූ
(5) කරයි, දුවයි, බලයි, කියයි (……)

1.16. සමාසයක් **නො වන** වචනයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) අකුසල්, අයහපත්, උපකාර, යාවජීව
(2) ගත්කරු, බුදුගුණ, මල්පොකුර, සඳඑළිය
(3) අරමුණු, පොල්තෙල්, බලුනකුට, සිල්රෙදි
(4) පොතපත, මල්දම්, රියපොළ, හිරුසඳු
(5) කළුකෙස්, දිගගවුම, නිලුපුල්, රතුමල් (……)

1.17. එක ම වර්ගයට අයත් සන්ධි පද ඇතුළත් වරණය තෝරන්න.
(1) අරුණාලෝක, නරේන්ද්‍ර, ස්වෝත්සාහ, මහාධිකරණය
(2) ලෝකෝත්තර, පුරුෂෝත්තම, විද්‍යෝදය, බහුපකාර
(3) ජාතිකානුරාගය, දැගසව්, බුත්සරණ, බුද්ධීන්ද්‍රිය
(4) අග්‍රාමාත්‍ය, ආත්මාරක්ෂාව, උපමාලංකාර, අමාත්‍යාංශය
(5) මලසුන, අල්ලස්, ඉන්නල, උනුන් (……)

1.18. ව්‍යාකරණානුකූල ව **නො ගැළපෙන** වරණය කුමක් ද?
(1) දකුණත, යනෙන, සුරිඳු, හිගුරල
(2) මැටිබඳුන්, කිරිබත්, රන්කම්, මිරිස්කුඩු
(3) විසින්, බඳු, නොහොත්, කෙරෙන්
(4) අප, උප, අදි, අති
(5) ස්වර්ණමය, රන්මුවා, සිල්වත්, බීමත් (……)

1.19. ව්‍යාකරණානුකූල ව නිරවද්‍ය වාක්‍යය තෝරන්න.
(1) මාර්ග නීති උල්ලංඝනය කළ සිවුදෙනකු අත්අඩංගුවට ගන්නා ලදි.
(2) සියලු ඥාති මිත්‍රාදීන් මේ නිවේදනය පිළිගනිත්වා!
(3) රජතුමා විසින් සංඝමිත් මෙහෙණින් වහන්සේ ගරු බුහුමනින් පිළිගන්නා ලදි.
(4) දියණියන් ආපසු ගමට ගියා ය.
(5) ජනතාව හමුවේ දේශපාලකයන් ආදර්ශවත් ව කටයුතු කළ යුතු ය. (……)

1.20. ලේඛන ව්‍යවහාරයට අනුකූල වාක්‍යය සහිත වරණය තෝරන්න.
(1) ඇමති මණ්ඩලයේ පදවි බාර ගන්න ඇතැමුන් ඉදිරිපත් වෙන්නේ නැහැ.
(2) කාගේවත් වරදක් කියන්නට කමක් ඇත්තේ නැතැයි මා විසින් කීවා.
(3) කොළඹට පැමිණි මොහු පිටරට යුද පිණිස නැව් නැගුමට යෙදුණා.
(4) ඔවුන් නිසා දැන් ගම්වලත් ඒ සිරිත පැතිරෙනවා.
(5) මේ කතාව ඉදිරිපත් කරන්නේ ගැමියකුගේ දෘෂ්ටිකෝණයෙනි. (……)

(ලකුණු 20 යි.)

* *